# ලාංකේය සාම්ප්‍රදායික කෘෂිකර්මයේදී භාවිත චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාසයන්හි ඵලදායීත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කපුකොටුව කේ.ජී.ඒ.එම්.

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජයීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ
ayeshakapukotuwa@gmail.com

**සාරසංක්ෂේපය**

කෘෂිකර්මය යනු ගොවිතැන, ගොවි කර්මාන්තය හා වැවිලි සම්බන්ධ විද්‍යාවයි. ලාංකේය සාම්ප්‍රදායික කෘෂිකර්මයේදී භාවිත පරිසරය හා බැඳි චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාසයන් භාවිතයේ ඵලදායීත්වය විමර්ශනයෙහි ප්‍රමුඛ සංකල්පයකි. චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාස යනු යම් පුද්ගලයෙකු විසින් කළ හා නොකළ යුතු දෑ හා ස්වකීය ආගම, සංස්කෘතිය හා දෙවියන් පිළිබඳ ව මනසෙහි සිතුවම් කර ඇති රූපයකි. ගම්මඩු ශාන්ති කර්ම, කිරි කොරහා නැටීම, නැකතට වැඩ ඇල්ලීම, කුඹුරට පිරිත් පැන් ඉසීම, රිට්ටා අනුව බිත්තර වී පැළ කිරීම ආදී චාරිත්‍ර හා විශ්වාසයන් කෘෂිකර්මාන්තයේ පවතී. කෙසේ වෙතත් මෙකී සංකල්පය මිනිස් සමූහයා පාරම්පරික ඥානයෙන් ලද උරුමයකි. එය වර්තමානය දක්වා මානව ප්‍රාථමික සන්නිවේදනය මගින් අද සමාජය වෙත ප්‍රවාහනය විය. කෘෂිකර්මයේ නිරත වූ ගොවියා සොබාදහම හා අදෘශ්‍යමාන බලවේගයන්හි බැල්ම ,ආශිර්වාදය ඉතාමත් දැඩි විශ්වාසයෙන් යුතුව අපේක්ෂා කරන ලදී. ලාංකේය සාම්ප්‍රදායික කෘෂිකර්මයේදී භාවිත චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාසයන් භාවිතයේ ඵලදායීත්වයත්වයක් තිබේද යන්න අධ්‍යයනය කිරීම මෙහි අධ්‍යයන ගැටලුව වේ. වත්මන් අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වශයෙන් ලාංකේය සාම්ප්‍රදායික කෘෂිකර්මයේදී භාවිත චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාසයන් භාවිතයේ ඵලදායීත්වය හා ඒ හා බැඳි විද්‍යාත්මක පදනම ගවේශනය කිරීමත්, උප අරමුණ වශයෙන් ගැමි විඥාණය තුළින් චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාසයන්ගේ ඵලදායීත්වයේ හේතූන් පැහැදිලි කර ගැනීමත්, එහි වත්මන් ප්‍රායෝගිකත්වය විමසා බැලීමත් සිදු විය. අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක ප්‍රවේශය භාවිත කළ අතර නියැදිය වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ, දොලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ,පල්ලේ දෙල්තොට ග්‍රාම නිලධාරී වසමේ ගොවීන් 30 දෙනෙකුගෙන් යුත් පිරිසක් යොදා ගන්නා ලදී. දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය වශයෙන් ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය හා නිරීක්ෂණ ක්‍රමවේදය භාවිත කරන ලදී. උක්ත ක්‍රමවේදයන් ඔස්සේ ලබා ගත් දත්තයන් අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය ඔස්සේ විශ්ලේෂණයට බඳුන් කරන ලදී. එම දත්ත අනුව ලාංකේය සාම්ප්‍රදායික කෘෂිකර්මයේදී භාවිත චාරිත්‍ර වාරිත්‍ර හා විශ්වාසයන්ගේ ඵලදායීත්වයක් ඇති බවට කරුණු අනාවරණය හා එයට හේතු සාධකයන් ඇත යන්න නිගමනය වශයෙන් ලබා ගන්නා ලදී.

**ප්‍රමුඛ පද:** *කෘෂිකර්මාන්තය, චාරිත්‍ර වාරිත්‍ර, ඵලදායීත්වය, විශ්වාසයන්, සාම්ප්‍රදායික*